
[Public]



# විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ ශ්‍රම සංක්‍රමණයෙහි කාර්තුමය විවරණිකාව

**සිව්වන කාර්තුව - 2023**


ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## ප්‍රධාන කරුණු ....

- 2023 වසර තුළ වැඩිම විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අගයක් වාර්තා කරමින්, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 475.6ට සාපේක්ෂව, 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 569.7ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.
- 2023 වසර තුළ දී ලැබුණු සමස්ත විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 5,969.6ක් විය.
- 2023 වසරේ සිව්වන කාර්තුව තුළ දී වැඩිම ප්‍රේෂණ ප්‍රමාණයක් ලැබී ඇත්තේ කුවේට්, කටාර් සහ එ.අ. එමීර් රාජ්‍යය යන රටවල් වලිනි.
- 2023 වසර තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රමිකයන් ප්‍රමාණය 297,656ක් වූ අතර, එහි මාසික සාමාන්‍යය 24,805ක් විය.


### විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්හි ප්‍රවණතා

**රූප සටහන 1: විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල මාසික වෙනස්වීම**




*මූලය: බලපත්‍රලාභී බැංකු*


**රූප සටහන 2: වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (%)**




*මූලය: බලපත්‍රලාභී බැංකු*

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල 2023 වසරේ තෙවන කාර්තුවේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 507ක මාසික සාමාන්‍යයට සාපේක්ෂව 2023 වසරේ සිව්වන කාර්තුවේ දී එ.ජ. ඩොලර් මිලියන 541ක මාසික සාමාන්‍යයක් වාර්තා විය.**

**රූප සටහන 3: ගමනාන්ත රට අනුව විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් (කාර්තුව 4 - 2023) (අ)**




*මූලය: බලපත්‍රලාභී බැංකු*


**වැඩිම විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රමාණයක් කුවේට්, කටාර්, එ.අ. එමීර් රාජ්‍යය, සහ සෞදි අරාබිය යන රටවලින් ලැබී ඇත.**

(අ) අනෙකුත් රටවලින් ලැබුණු එ.ජ. ඩොලර් මිලියන 116.4ක සහ ඇතැම් ගෝලීය ප්‍රේෂණ මාර්ග, ජංගම යෙදුම් (Mobile Apps) සහ වෙනත් මාර්ග හරහා ලැබුණු එ.ජ. ඩොලර් මිලියන 245.7ක විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ගමනාන්ත රට අනුව වර්ගීකරණයේ දී ඇතුළත් නොවේ.

(ආ) ඇ.එ. ජනපදයෙන් සහ එක්සත් රාජධානියෙන් ලැබෙන ප්‍රේෂණවලට ප්‍රධාන වශයෙන් දේශසීමා අතර සිදුවන විදේශ විනිමය ගනුදෙනු විධික්‍රම හේතුවෙන් වෙනත් මූලාශ්‍ර රටවලින් යැවූ ප්‍රේෂණ ඇතුළත් වේ.


[Public]

රූප සටහන 4: විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල කාර්තුමය ප්‍රවණතාව (2020 - 2023)




*මූලය: බලපත්‍රලාභී බැංකු*


රූප සටහන 5: විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල මාසික සාමාන්‍යය (2020 - 2023)




*මූලය: බලපත්‍රලාභී බැංකු*

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සහ විදේශ රැකියා සඳහා පිටත්වීම්වල ක්‍රියාකාරිත්වය

රූප සටහන 6: විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ විදේශ රැකියා සඳහා පිටත්වීම්





*මූලයන්: බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මෑත මාසවල හිතකර මට්ටම්වල පැවති අතර පෙර වසරට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 6ක් පමණ වූ ඉහළ මට්ටමක පැවතුනි.**


## විදේශ රැකියා සඳහා පිටත්වීම්වල ප්‍රවණතා

රූප සටහන 7: විදේශ රැකියා සඳහා පිටත්වීම්වල මාසික වෙනස්වීම




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

රූප සටහන 8: ගමනාන්ත කලාපය අනුව පිටත්වීම් - 2023





*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**2023 වසරේ තුන්වන කාර්තුව හා සසඳන විට 2023 වසරේ සිව්වන කාර්තුව තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු ප්‍රමාණය යම් පහළ යෑමක් පෙන්නුම් කළේය.**


**2023 වසරේ විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රමිකයන්ගෙන් බහුතරයක් මැද පෙරදිග කලාපයට (78.3%) විය.**

**රූප සටහන 9: විදේශ රැකියා සඳහා පිටත්වීම්වල කාර්තුමය ප්‍රවණතාවය (2020 - 2023)**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*


**රූප සටහන 10: විදේශ රැකියා සඳහා පිටත්වීම්වල මාසික සාමාන්‍යය (2020 - 2023)**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*


## රැකියා මට්ටම් අනුව විදේශ රැකියා සඳහා පිටත්වීම් : 2023

**රූප සටහන 11: ස්ත්‍රී පුරුෂ භාවය සහ රැකියා වර්ගය අනුව පිටත්වීම් සංඛ්‍යාව - 2023**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**රූප සටහන 12: රැකියා මට්ටම අනුව විදේශ රැකියා සඳහා පිටත්වීමේ සංයුතිය - 2023**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*


**සංශෝධිත රැකියා වර්ගීකරණය අනුව විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පිරිමි සහ කාන්තා ශ්‍රමිකයන් යන දෙඅංශයම පුහුණු කාණ්ඩය කෙරෙහි වැඩි වශයෙන් යොමු වී ඇත.**

**සංශෝධිත රැකියා වර්ගීකරණය අනුව විදේශ රැකියා සඳහා පිටත්ව ගිය සමස්ත සේවා නියුක්තිකයන්ගෙන් 70%කට ආසන්න ප්‍රමාණයක් යොමු වී ඇත්තේ පුහුණු කාණ්ඩය වෙත වේ.**

සටහන: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ඔවුන්ගේ රැකියා වර්ගීකරණය පුහුණු සහ නුපුහුණු ශ්‍රමිකයන් පමණක් පිළිබිඹු වන පරිදි සංශෝධනය කර ඇති අතර, වෘත්තීමය මට්ටම, ලිපිකරු හා ඒ ආශ්‍රිත, මධ්‍යම මට්ටම, පුහුණු, අර්ධ පුහුණු සහ නුපුහුණු ලෙස වූ පෙර රැකියා වර්ගීකරණය මත පදනම් වූ විදේශ රැකියා සඳහා පිටත්වීම් දත්ත පළ කිරීම අත්හිටුවා ඇත .

## ස්ත්‍රී පුරුෂ භාවය සහ රට අනුව විදේශ රැකියා සඳහා පිටත්වීම්වල ප්‍රවණතාවය : 2023


**රූප සටහන 13: ගමනාන්ත රට සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව කාර්තුමය පිටත්වීම් - 2023**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*


## වයස් කාණ්ඩය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව විදේශ රැකියා සඳහා මුළු පිටත්වීම් : 2023

**රූප සටහන 14: වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව විදේශ රැකියා සඳහා මුළු පිටත්වීම්**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**රූප සටහන 15: ස්ත්‍රී පුරුෂ භාවය අනුව විදේශ රැකියා සඳහා මුළු පිටත්වීම්**





*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පිරිමි ශ්‍රමිකයන්ගෙන් වැඩිම ප්‍රමාණයක් (20%) වයස අවුරුදු 25-29 කාණ්ඩයේ පසුවන අතර විදේශ රැකියා සඳහා පිටත්ව ගිය කාන්තා ශ්‍රමිකයන් වැඩිම ප්‍රමාණයක් (20%) වයස අවුරුදු 40-44 කාණ්ඩයේ පසු වේ.**


## සමස්ත පිටත්වීම් (විදේශ රැකියා සඳහා පිටත්වීම් ද ඇතුළුව ) සහ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම්

**රූප සටහන 16: ශ්‍රී ලංකාවෙන් සිදු වූ සමස්ත පිටත්වීම් (මාසිකව)**




*මූලය: ආගමන හා විගමන දෙපාර්තමේන්තුව*

**රූප සටහන 17: විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම් (මාසිකව)**





*මූලය: ආගමන හා විගමන දෙපාර්තමේන්තුව*

**2022 වසරට සාපේක්ෂව 2023 වසර පුරාවට මාසිකව රටින් පිටත්ව ගිය සමස්ත පුද්ගලයන් ගණන ඉහළ අගයක පැවතුණි.**

**2023 වසරේ සිව්වන කාර්තුව තුළ දී නිකුත් කරන ලද විදේශ ගමන් බලපත්‍ර සංඛ්‍යාව, 2022 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, යම් අඩුවීමක් පෙන්නුම් කළේය.**

## විදේශ රැකියා සඳහා පිටත්වීම් සහ ශ්‍රී ලංකාවෙන් සිදු වූ සමස්ත පිටත්වීම් අතර සම්බන්ධතාව

**රූප සටහන 18: විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රමිකයින් ගණන ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය සමස්ත පුද්ගලයන්ගේ ප්‍රතිශතයක් ලෙස**





**2022 වසරට සාපේක්ෂව 2023 වසර තුළ විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රමිකයන් ගණන ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය සමස්ත පුද්ගලයන්ගේ ප්‍රතිශතයක් ලෙස සාපේක්ෂව අඩු අගයක පැවතුණි.**

සටහන: සමස්ත පිටත්වීම්වලට ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය සමස්ත පුද්ගලයන් ගණන ඇතුළත් වේ.

## විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රමිකයන්ගේ ඝනත්වය

**රූප සටහන 19: දිස්ත්‍රික්කය අනුව ජනගහනය 100,000කට විදේශ රැකියා සඳහා පිටත්වීම්**





● - සංක්‍රමණ ඝනත්වය නියෝජනය කරයි.

*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**2022 සහ 2023 වසරවල දී සෑම දිස්ත්‍රික්කයකම ජනගහනයට සාපේක්ෂව විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රමිකයන්ගේ වැඩිම ප්‍රමාණය මඩකලපුව දිස්ත්‍රික්කයෙන් වාර්තා විය.**

## කලාපීය සංසන්දනය

**රූප සටහන 20: 2022 සහ 2023 වසර වලදී දකුණු ආසියානු රටවල් වෙත ලැබුණු විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




*මූලය: KNOMAD/ලෝක බැංකුව, 2024.*